**මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ (ජාජසජම කොටස) - 2014**

---

මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ (ජාජසජම කොටස) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557/2558 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 11 ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කොළඹ මහනගර සහා ප්‍රදේශය ඇතුළත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ මහනගර සභාව වගකීම දරන අතර කොලොන්නාව නගර සභාව හා දෙහිවල / ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශය ඇතුළත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වගකීම් දරයි. අප ජලය කළමනාකරණ සේවා මඟින් මහ කොළඹ ප්‍රදේශයේ නාගරික හා උප නාගරික නිවැසියන් සඳහා නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වනුයේ, ව්‍යාපෘති ප්‍රදේශය තුළ දළ වශයෙන් 645,000 ක් වූ නිවැසියන් සඳහා අප ජලය කළමනාකරණ සේවා වැඩි දියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 13,410 කට සමාන එජඩො මිලියන 116.6 ක් වන අතර ඉන් රු.මිලියන 9,200.8 කට සමාන එජඩො මිලියන 80 ක් හෙවත් සියයට 68.6 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (OCR) මගින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. තවද රු. මිලියන 2,300.2 කට සමාන එජඩො මිලියන 20 ක් හෙවත් සියයට 17.1 ක් ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත් (SFR) මඟින් ශ්‍රී ලංකා රජයට මූල්‍යායනය කිරීමට එකඟ වී තිබූ අතර ඉතිරි මුදල වූ රු. මිලියන 1,909 කට සමාන එජඩො මිලියන 16.6 ක් හෙවත් සියයට 14.3 ක් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලැබේ. ව්‍යාපෘතියේ ඉහත සඳහන් ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු. මිලියන 1,012.03 කට සමාන එජඩො මිලියන 8.8 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරනු ලබන කාර්යයන් සඳහා වෙන් කර තිබුණි.

තවද, ශ්‍රී ලංකා රජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර අතිරේක මූල්‍ය ගිවිසුමක් 2010 ජූලි 02 දින අත්සන් කරන ලදී. එම අතිරේක මූල්‍ය ගිවිසුම අනුව, ණය මුදලින් ප්‍රදානයක් ලෙස සියයට 82.5 ක හා ණයක් ලෙස සියයට 17.5 ක සම්මිශ්‍රණයකින් වූ රු. මිලියන 647.68 කට සමාන විගැහි මිලියන 3.7 ක් (එජඩො මිලියන 5.64) සැපයීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 364.35 කට සමාන එජඩො මිලියන 3.17 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. 2009 දෙසැම්බර් 18 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබූ අතර 2014 දෙසැම්බර් 31 වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද පසුව ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2017 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්,

ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබු කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියමකර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩුව

--------------------------

2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.82 ක් වටිනා ව්‍යාපෘතියේ දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

-------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 මාර්තු 31 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළයුතු 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 3.82 ක්වූ දේපල, පිරියත හා උපකරණ, මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 5.63 | 647.68 | 200.00 | 1.405 | 183.82 | 1.405 | 183.82 |
| ශ්‍රී ලං ර | 3.17 | 364.35 | 50.00 | 0.108 | 14.11 | 0.458 | 59.06 |
| එකතුව | 8.80 | 1,012.03 | 250.0 | 1.513 | 197.93 | 1.863 | 242.88 |

3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙහිවල, ගල්කිස්ස හා කොලොන්නාව නගර සහා ප්‍රදේශවල පිහිටා ඇති අප ජලය පොම්ප කිරීමේ මධ්‍යස්ථාන 06 ක් පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කර වර්ෂ 05 කට පසුව 2014 වර්ෂයේදී පිරිනමා තිබුණි. එබැවින් ඉතිරි වර්ෂ 03 ක කාල පරිච්ඡේදය තුළ එම කොන්ත්‍රාත් නිමකිරීම සැකසහිතය.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 19 ක් හා සියයට 24 ක් විය. තවද 2014 වර්ෂය සඳහා රජයේ අයවැයෙන් වෙන්කරන ලද රු.මිලියන 250 ක මුදලක්, ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම හා සැලසුම් අදියරේදී දීර්ඝ කාලයක් ගත කිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන කරුණු

ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබුණද පරිවයක් වශයෙන්, ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකර ව්‍යාපෘතියෙන් සියයට 20 ක් පොදුකාර්ය වියදම් සඳහා අයකර තිබුණි. එසේ ව්‍යාපෘතිය විසින් 2014 වර්ෂය දක්වා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවන ලද පොදු කාර්ය වියදම රු.මිලියන 7.21 ක් විය.

3.4 මූල්‍ය පාලනය පිළිබඳ කරුණු

මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයකට භාජනය කර නොතිබුණි.